මා පසුගිය සන්නස සඟරාවේ සුබස් සිතිවිලි ලිපියෙන් අවසන් කලේ දස ලක්ස අනූනව දහස් නවසිය අනූනවය (1,099,999) හැදෙන්නේ, දස ලක්සයට (1,000,000) අනූනවදහස් (99,000) නවසිය (900) අනූ නවයක් (99) එකතු වීමෙන් බව පෙන්වා දෙමිනි. එයට තවත් එකක් (1) එකතු වූ විට (1,099,999 + 1) හැදෙන්නේ එකොලොස් ලක්සය (1,100,000) ය්. අපේ බාසා නියරට අනුව "දස දහස් දෙසිය පනහ" යනු දස දාහේ ඒවා දෙසිය පනහ නොවේ. එහි අදහස වන්නේ දසදාහක් සහ දෙසිය පනහක් (10,250) යන්නය්. 10,001, 10,002, 10,003 ආදී වශයෙන් එක එක එකතු වී 10,250 හැදෙන බවය්. මම ඔබට රු. 10,000 (දස දහස) ක් නය වී සිටියෙමි. අදත් මම ඔබෙන් රු. 250 ක් ඉල්ලා ගනිමි. දැන් මා ඔබට රු. 10,000 + 250 = දහදාස් දෙසිය පනහක් නය ය්.

එසේම ඉඩමක් ගැනීම සඳහා රුපියල් දස ලක්සයක් වියදම් කල කෙනෙකුට නොතාරිස් ගාස්තුව වශයෙන් තවත් රුපියල් විසිපන්දාහක් වියදම් විය. ඉඩම ගැනීම සඳහා ඔහු වියදම් කල මුල මුදල රුපියල් දස ලක්ස විසිපන් දාහ (1,025,000) කි. එය 1,000,000 ං 25,000 = 25,000,000,000 දෙදහස්

# සුබස් සිතිවිලි

ලංකා රජය මෙය නිවැරදි කිරීමේ වගකීම බාර ගත යුතුය. රාත්තල් සහ යාර කිලෝග්රෑම් සහ මීටර් කිරීම අප විසින් කරන ලද්දක් නොවේ.
දස දහස් දෙසිය පනහේත් දස ලක්ස දෙසිය පනහේත් නියම තේරුම ගත නොහැකි, ලංකාවේ උපන් සිංහලයකුට නමක් තැබිය යුතුය.



වි ක ධර්මබන්ධු

ඉඩම් වෙනේසේසි කරුවකු නිට්ටඹුව පලාතේ ඉඩමක් වෙන්සෙ-"දි කිරීම සඳහා සකස් කල දැන්වීමක "රජ පා පහස ලත් මේ ඉඩම" යන වැකි කඩ ද දක්නට ලැබිනි.

කොන්ඩය බැඳීමත් බුලත් විටක් කටේ පුරවා ගෙන සිටීමත් අපේ මුත්තන්ගේ සිරිත විය. අද අපේ රටේ" මය්නකු" සොයා ගත හැකි දැය් මම නොදනිමි.

අතීතයේ පැවති වියත, පියවර, රියන, බඹය, අහෝසි වී යාර, අඩි, අඟල් බාවිතයට පැමිනි බව දනිමි. එහෙත් එය වෙනස් වූයේ කෙසේ ද ? කවදා ද ?" යන්න ගැන දැනීමක් නැත. මින් වසර තිහකට පමන පෙර හඳුන්වා දෙන ලද මීටර් ග්රෑම් ලීටර් ක්‍රමයට උරන වී හඬා වැටෙන්නේ නැත. 1980 දසකයේ සිටි අද්‍යාපන ඇමතියා "ඔය පාර ටෙන ය හන්ඩ්‍රඩය තව්තිසනයත් ඒව්" යැය් කියමින් තප්පු ලෑවේ මිලියන් ක්‍රමය පටන් ගැනීම ගැන උදහස් වෙමිනි.

# කඩුලු පොල්ල මත ඉඳ ගෙන අමුඩය ගැසීම හෙවත් දස ලක්ෂයේ හරඹය 2

පන්සිය මිලියනයක් හෙවත් දෙසිය පනස් කෝටියක් නො වේ.

2012. 03. 25 වැනිදා (ශ්‍රී ලංකා ශබ්දවාහිනී) ශ්‍රී ලංකා ගු. විදුලියේ "සිටි එෆ්. එම්." සේවයෙන් "දෙමිලියන හැත්තෑ පන්ලක්ස විසිපන්දාහ" වැනි ගනනක් කියවිනි. එය හරියට වී බුසල් 75 ය් (කිලෝග්රෑම්) ලීටර් 45 වැනි ගනනකි. තෙතමනය අනුව බර අඩු වැඩි වන නිසා සමහරු ලීටර් බාවිතා කරති.

මිලියන ක්‍රමයට ලක්ස ගෑවිය නොහැකිය. 1000 ං 1000 = 1,000,000 = මිලිනිය වේ. සිංහල ක්‍රමයට අනුව (999,000) නවසිය අනූනව දාහක් නැතත්, මිලින ක්‍රමයට අනුව එබඳු වියහරක් ඇත.

යාර අඩි වියත් හෝ ගව් යොදුන් මය්ල යාර වියහරක් නැත.

"පංකෝටි පන්ලක්ස පන්දහස් පන්සිය (පන්දසය) පනහ (පන්දස - පන් + අස - පනස - පනහ) යනු අපේ බස් නියරට අනුව ලියවුනු ගනනකි. එය මිලිනි ක්‍රමයට කියන්නේ පනස් මිලිනි (මිලියන) පන්සිය පන් දහස් පන්සිය පනහ යනුවෙනි.

ඉස්කෝලෙ යන කාලේ අප කියූ කියමනක් මෙහිදී මතකයට එය්. "මූට නමක් තියාපියෝ - පන්ඩිතයය් කියාපියෝ" සමහර විට "පන්ඩිතයා" වෙනුවට "ගොන්තඩියා - මී හරකා - මහා-සෝනා" වැනි පදත් වියහර විය.

අපි අපේ ජාතික ඇඳුම යැය් කියන්නේ ඉන්දියාවේ මිනිසුන්ගේ ඇඳුමටය්. එය අසන ඉන්දියානුවකු "ඒක තොපේ ජාතික ඇඳුම උනේ කොහොමදැය් නාසන්නේ උගේ හැදිච්ච කම නිසා ද ? මෝඩකම නිසාද ?" යන්න මම නොදනිමි.

අපි "අපේ බුදුන්" වඳින්නට සිරිපා (කන්ද) කරුනා කරමු. එතැන බුදුන් වහන්සේ තම පා සටහන ඔබා ඇති මහා - ආ මැනිකක් තිබුනු බවත් අද එය වසා ඇති බවත් කියති.

එය සොයා ගන්නා ලද්දේ නිස්සංකමල්ල නම් කාලිංග වංශික රජතුමා විසින් බවත් කියති. දුටුගැමුනු රජතුමා සිරිපා වැඳපුදා ගන්නට තරම් පින්වත් නො වී ය. එතුමාගේ කාලය වන විට මෙය එලිදරව් වී නොතිබිනි.

## 2012 සංස්කෘතික විවිධත්ව සතිය

2012 සංස්කෘතික විවිධත්ව සතියෙහි (Cultural Diversity Week) සුසංවාදී දිනය (Harmony Day) සැමරුම මාර්තු 21 දින කේසී නගර සභාවේ ජෝන් පැන්ඩපලස් පොදු ශාලාවෙහිදී මහත් උත්කර්ශවත් අන්දමින් පැවැත්විණි එම ශාලාවට අනුබද්ධ ශ්‍රී ලාංකික මොරිසස් ඉතාලි හංගේරියන් පිලිපීන පෝලන්ත සහ චීන වැඩිහිටි සංගම් නැටුමෙන් ගැයුමෙන් සහ ඇඳුමෙන් පැළඳුමෙන් සංස්කෘතික විවිධත්වය ප්‍රදර්ශනය කළහ

පොදුශාළා සභාපති Brian Oates පිළිගැණීමේ කතාව කළ අතර ආරාධිත අමුත්තන්වූ වික්ටෝරියාණු පාර්ලිමේන්තු මන්ත්‍රී John Pandazopoulos සහ Luke Donella, කේසී මහ නගර සභා මංත්‍රිණී Linette Calalum සභාව ඇමතූහ උත්සව සභාව මෙහෙයවනු ලැබුවේ ශ්‍රී ලාංකික වැඩිහිටි ශුභසාධක සංගමයේ සභාපති තිස්ස අමරසේකර විසිනි













වි ක ධර්මබන්ධු

# සුභාෂිතයෙන්

| | |
|---|---|
| සුදන ගුනෙන් යුතු උතුමන්ගෙ | පියකරු |
| අබමත තින් තිර සිත නොකල හැකි | දුරු |
| සිසිල ගුනෙන් යුතු දිය දහර | පිවිතුරු |
| මිටි මඟකින් යන කල නවතති | කව්රු |

**ගැදි පැදිය:**

සුදන ගුනෙන් යුතු

පියකරු උතුමන්ගෙ

අබිමත තින් තිර සිත

දුරු නොකල හැකිය

සිසිල ගුනෙන් යුතු

පිවිතුරු දිය දහර

මිටි මඟකින් යන කල

කව්ර නවතති !

**පැහැදුම:**

සත්පුරුස - ගුණ යහපත් කම ඇති, දකින්නට ආසා හිතෙන විදියේ උත්තමයන්ගේ, ස්තිර අදිස්ටානය (කාටවත්) වෙනස් ක නොහැකිය. (එය හරියට) සිසිල් දිය දහරාව පහත් තැනින් ගලා යන විට කිසි කෙනෙකුට (එය) නැවත්විය නොහැක්කාක් මෙනි.

**විසිතුර :**

සුදනන්ගේ අදිස්ටානය හොඳ එකකි. එය කාටවත් වෙනස් කල නොහැකිය. මගේ අදහස නම් සමහර විට එය වෙනස් කල හැකි බව ය. පන්සලක් හැදීමට තීරනය කර ගෙන සිටිච සුදනකුගේ සිත පාසලක් හැදීම සඳහා වෙනස් කල හැකි විය හැකිය. අනෙකකු නැසීමට තීරණය කර ගෙන සිටින දුදුනකුගේ සිත වෙනස් කල නොහැකි විය. එසේම එකිනෙකා වෙත පෙම් බැදි තරුනයකුගේ හෝ තරුනියකගේ සිත ද වෙනස් කල නොහැකි විය හැකිය. එ තැන දී සුදනකමේ බලපෑමක් නැත. පිරිසිදු සිසිල් දිය පමනක් නොව අපිරිසිදු උනුවතුරත් ඉහත් තැනින් ගලන සිරිතක් නැත. උස් තැනක ඇති ගලක් උවත් ඉහලට පෙරලන සිරිතක් නැත. අහසින් ගිය රිසිවරයකු අඩ නිරුවතින් දිය නාමින් සිටි අඟනක දැක රිදී බලය නැති වී බිමට වැටි බව අසා ඇත්තෙමි.

අබිමත'තින් = අබිමත අරතයෙන් = අබිමත ++ අරුතින් යන්න කිවියා අබිමත + අතින් යනුවෙන් ගෙන ඇත. අද කිවියන් " පිලිගමි - පිලිගමු" යනුවෙන් ලියනු දකින විට එඳු වැරදි ගනන් ගැනීම යුතු නැත. වෙනස් කල නොහැකි යන අදහස මෙහි දී ඇත්තේ "දුරු කල නොහැකි" යනුවෙනි. "දුරු" යනු දුර /ඈත යන තේරුමත් "නැති" යන තේරුමත් දෙන පදයකි.

මෙහි දක්වා ඇති දොස් කිවියන් අතින් සිදු වූ විට නොසලකා හල යුතු බව කියති.